# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2331/53 – 2023 මැයි මස 12 වැනි සිකුරාදා – 2023.05.12**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/01/2019/81.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.03.17 දිනැති හා අංක 2219/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.03.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, රත්මල්දෙනිය පාර, සුහද මාවත, අංක 179/12/ඒ හි ධම්මික ජයවර්ධන මයා (ඇතුළු සේවකයින් 49 දෙනා) සහ කොළඹ 02, නවම් මාවත, අංක 42 හි පිහිටි ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.03.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

ආරාවුල් අංකය : IR/COM/01/2019/81.

ධම්මික ජයවර්ධන මයා,
(ඇතුළු සේවකයින් 49 දෙනා),
අංක 179/ 12/ ඒ,
සුහද මාවත, රත්මල්දෙණිය පාර,
පන්නිපිටිය.

*(පැමිණිලිකරුවන්)*

*බේරුම්කරණ අංකය: A/29/2021.*

*එදිරිව*

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,
42, නවම් මාවත,
කොළඹ 02.

*(වගඋත්තරකරු)*

වර්ෂ 2023 ක් වූ මාර්තු මස 21 වන දින දීය.

බේරුම්කරණ ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධනය වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, ආරවුල් බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත කී පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වන්නේ,

"ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන්ට ගෙවමින් තිබූ විශේෂ ජීවන වියදම් දීමනාව, 2017.10.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කිරීමෙන් පහත නම් සඳහන් සේවකයන් 49 දෙනා හට අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

1. ධම්මික ජයවර්ධන මයා
2. ෂෙරීන් නිර්මාලා වන්නිතම්බි මෙය
3. ඩී. ටී. විජයරත්න මිය
4. එස්. හඳපාන්ගොඩ මිය
5. ඩබ්. ඩී. ඒ. පුෂ්පා රූපසිංහ මිය
6. ජීවනී සිරිවර්ධන මිය
7. යූ. කේ. දයානි වැගපිටිය මිය
8. එස්. එන්. තරංගනී මෙය
9. එන්. එන්. නාරන්දෙනිය මිය
10. ඕ. එම්. සී. කුමුදිනී මිය

11. ඩබ්. එම්. අයි. නිල්මිණි මෙය
12. පී. වී. ඒ. එම්. බද්දේගමගේ මිය
13. ඩී. කේ. ඩී. එස්. සිසිල් මයා
14. එම්. කේ. එස්. කේ මල්දෙනි මයා
15. සී. අමරසිංහ මයා
16. සී. දිසානායක මෙය
17. එස්. එස්. ජයවර්ධන මිය
18. එච්. ඩී. පත්බේරිය මයා
19. එස්. ඒ. ජී. සමන්ති මිය
20. කේ. එච්. ආර්. පී. ප්‍රනාන්දු මයා
21. එම්. ඩී. ඩී. ඒ දිසානායක මිය
22. කුමුදුනී ඉරුගල්බණ්ඩාර මිය
23. එස්. ආර්. පී. ඉන්ද්‍රකීර්ති මයා
24. උපුල් අක්මීමන මයා
25. රම්‍යා චාන්දනී ධර්මවර්ධන මිය
26. අයි. සී. අලහප්පෙරුම මිය
27. සී. පී. ජයසිංහ මයා
28. කේ. ඒ. වී. ප්‍රේමතිලක මිය
29. එන්. එච්. එම්. ජී. තිස්ස කුමාර මයා
30. සී. රත්නායක මෙය
31. ඩබ්. පී. ඒ. එන්. වීරවර්ධන මිය
32. එස්. ඒ. ජී. අනුරාධා මිය
33. එස්. ඒ. යූ. එම්. කේ. විජේකෝන් මිය
34. කේ. කේ. එස්. කන්නංගර මිය
35. ඒ. පී. වික්‍රමසේකර මයා
36. පී. කේ. සුමිත්‍රාරච්චි මිය
37. ජේ. සී. සී. ද සිල්වා මිය
38. ජයනි ගලගෙදර මිය
39. එම්. ටී. එන්. චන්ද්‍රසේන මිය
40. කේ. එම්. පී. කුලසේකර මයා
41. සී. ඩී. එස්. නුවරපක්ෂ මයා
42. ඩබ්. එච්. එම්. බී. සී. වීරරත්න මිය
43. ඩී. එම්. පී. දිසානායක මයා
44. ජී. එල්. සුසන්ත ප්‍රේමරත්න මයා

45. යූ. ඒ. ගමගේ මයා

46. අනෝමා කරල්ලියද්ද මිය

47. ජේ. එච්. ටී. කේ. ජයලත් මයා

48. කේ. එම්. කේ. ජයවර්ධන මිය

49. ගයනි විජයතිලක මිය

ඉහත ආරාවුල සම්බන්ධයෙන් පළමු හා දෙවන පාර්ශවයන් වැඩිදුර ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. ඒ අනුව පළමු පාර්ශවයේ පැමිණිලිකරුවන් කියා සිටින්නේ 1992.08.27 වන දිනැති මාණ්ඩලීය පත්‍රිකා අංක 1157 සහ 1992.10.29 දිනැති මාණ්ඩලීය පත්‍රිකා අංක 1172 මගින් අපනයන සංවර්ධන මණ්ඩලයේ 01 වන ශ්‍රේණියේ සිට 04 වන ශ්‍රේණිය දක්වා වූ විධායක නිලධාරීන් හට තම මූලික වැටුපෙන් 30% ක්, විශේෂ ජීවන වියදම් දීමනාවක් ලෙස ගෙවීමට අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබුණු බවත්, එකී විශේෂ ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා 1991.06.06 දිනැති ලිපිය මගින් වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුවෙන් ලබාගත් අනුමැතිය සහ එවකට භාණ්ඩාගාරයේ ලේකම්තුමාගේ වාචික අනුමැතිය මත මණ්ඩලය විසින් අදාල දීමනාව කාර්යය මණ්ඩලය වෙත ගෙවීමට කටයුතු කර ඇත. (1994.02.21 වන දින භාණ්ඩාගාර ලේකම්තුමාගේ ලිඛිත අනුමැතිය ලබා ගෙන ඇත. )

1997.04.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.2 ප්‍රකාර මෙම ජීවන වියදම් දීමනාව 1996.12.31 වන දිනට හිමි වැටුපට නියාමනය (Freeze) කර ඇති බවත් ය.

එමෙන්ම නීතිපතිවරයාගේ 2009.07.10 දිනැති ලිපිය මගින් එකී දීමනා නිසි අනුමැතිය ඇතිව ගෙවන ලද්දක් බව සහ එම දීමනා ගෙවීම මගින් මණ්ඩලය නීති විරෝධී ලෙස කටයුතු කර නොමැති බවත්, මණ්ඩලය මගින් 2010 අගෝස්තු 01 වෙන දිනට පසු බඳවා ගත් කාර්යය මණ්ඩලයට මෙම දීමනා ගෙවීම සිදුකොට නොමැති බවත් පවසා සිටී.

තවද පැමිණිලිකරුවන් පවසා සිටින්නේ 2017.10.25 වන දින නිකුත් කරන ලද 05/2017 කළමණාකරණ සේවා චක්‍රලේඛය අනුව 1992 සිට ගෙවමින් තිබූ විශේෂ ජීවන වියදම් දීමනාව තවදුරටත් ලබා දිය හැකි ද යන්න පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කළ විමසීමේදී අදාල ජීවන වියදම් දීමනාව ගෙවීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව ඔවුන්ගේ 2018.07.09 දරන ලිපිය මගින් දක්වා ඇති බව කියා සිටී. මේ අනුව විශේෂ ජීවන වියදම් දීමනාව ගෙවීම 2017.10.17 වන දින සිට නතර කර ඇත.

එමෙන්ම වගඋත්තරකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ද ඉහත පැමිණිලිකාර පාර්ශවයන් විසින් දක්වන ලද කරුණු ඒ ආකාරයෙන්ම දක්වමින් කියා සිටින්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යොමුකිරීම මත කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් යොමුකරන ලද 2018.07.09 දින දරන ලිපිය අනුව අදාල ජීවන වියදම් දීමනාව ගෙවීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බව දන්වා ඇති බැවින් විශේෂ ජීවන වියදම් දීමනාව තවදුරටත් ලබාදිය නොහැකි බවයි.

ඒ අනුව කාර්මික අධිකරණයට විසඳිය යුතු ප්‍රශ්න කවරේද? යන්න පහත සඳහන් පරිදි දක්වා සිටිමි.

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 05/2017 චක්‍රලේඛය ඔස්සේ 2018.07.09 දිනැති ලිපිය එය පදනම්ව ධම්මික ජයවර්ධන මහතා ඇතුළු සේවකයින් 49 දෙනාට ගෙවමින් තිබූ විශේෂ ජීවන වියදම් දීමනාව 2017.10.07 වන දින සිට නතර කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුවී තිබේ ද ?

එසේ අසාධාරණයක් වී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද ? යන්නයි.

වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරය වන්නේ කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 පිළිබඳ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ විමසීම මත, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018.07.09 වන දින ලිපිය අනුව ජීවන වියදම් දීමනාව ගෙවීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බව යන්නයි.

අපනයන සංවර්ධන මණ්ඩලයේ 1992.08.27 දිනැති මාණ්ඩලික පත්‍රිකා අංක 1157 සහ 1992.10.29 දිනැති මාණ්ඩලීය පත්‍රිකා අංක 1172 යන මාණ්ඩලීය පත්‍රිකා පිළිබඳ අවධානය යොමු කරමි.

එම මණ්ඩලීය පත්‍රිකාවලට අනුව අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අරමුණ වී ඇත්තේ, අපනයන සංවර්ධනයක් අපේක්ෂා කළ අපනයන සංවර්ධන මණ්ඩලය ඒ වෙනුවෙන් කැපවී කටයුතු කරන ඔවුන්ගේ පුහුණු කාර්ය මණ්ඩලය සඳහා දිරිගැන්වීමක් වශයෙන් සහ වැඩිවන ජීවන වියදමට සහනයක් වශයෙන් සේවකයන් වෙත ගෙවනු ලබන විශේෂ දීමනාවක් ලෙස විශේෂ ජීවන වියදම් දීමනාවක් ලබා දීමටය.

ඒ අනුව විසඳිය යුතු ප්‍රශ්නවලට ප්‍රථම 05/2007 කළමනාකරණ සේවා චක්‍රලේඛය වෙත අවධානය යොමු කරමි.

05/2007 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 02. III ඡේදයේ පහත සඳහන් පරිදි වේ.

02. III This allowance shall only be entitled to the officers, who are not receiving any other special allowance other than language proficiency allowance, transport allowance, risk allowance, telephone allowance and the adjustment allowance and cost of living allowance which are paid as per the above circular.

ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් 5/2007 චක්‍රලේඛයේ 2 III වගන්තියේ සඳහන් විශේෂ දීමනාවලට හිමිකම් කියනු ලබන නිලධාරින්ටද වෘත්තීය දීමනා ලබා ගැනීමට හිමිකමක් ඇතිබව සඳහන් වේ. ඒ අනුව එහි විශේෂ දීමනාවක් ලෙස ජීවන වියදම් දීමනාව සඳහන් වී ඇත.

එය අපනයන සංවර්ධන මණ්ඩලයේ 1992.08.27 මණ්ඩලීය පත්‍රිකා අංක 1157 සහ 1992.10.29 මණ්ඩලීය පත්‍රිකා අංක 1172 හි සඳහන් විශේෂ ජීවන වියදම් දීමනාව වශයෙන් ආදේශ කර ගැනීමට හැකියාවක් පවතින බව කාර්මික අධිකරණයට පෙනී යයි.

එබැවින් 5/2007 චක්‍රලේඛයේ සඳහන් වෘත්තීය දීමනා ලබා ගැනීම ඔවුන් පෙර ලබමින් සිටි විශේෂ ජීවන වියදම් දීමනාව අහිමි වීමට හේතුවක් නොවන බව පෙනී යයි.

ඒ අනුව පැමිණිලිකාර පාර්ශවයෙන් සහ වගඋත්තරකාර පාර්ශවයෙන් ගොනුකර ඇති ලේඛන සහ දේශන පරීක්‍ෂා කිරීමෙන් අපනයන සංවර්ධන මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන්ට ගෙවමින් තිබූ විශේෂ ජීවන වියදම් දීමනාව, 2017.01.17 වන දින සිට නතර කිරීමෙන් ධම්මික ජයවර්ධන මහතා ඇතුළු උපලේඛනයේ සඳහන් සේවකයින් 49 දෙනාට අසාධාරණයක් සිදුවී ඇති බව කාර්මික අධිකරණයට පෙනී යයි.

එබැවින් එම දීමනාව ලබා ගැනීමට පැමිණිලිකාර පාර්ශවයට හිමිකමක් පවතින බව තීරණය කරමි.

**ප්‍රදානය**

පැමිණිලිකාර පාර්ශ්වයෙන් සහ වගඋත්තරකාර පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ සහ ගොනුකරන ලද ලේඛන සළකා බැලීමෙන් පසුව පහත තීරණයන්ට එළඹීයෙමි.

අපනයන සංවර්ධන මණ්ඩලයේ 01 වන ශ්‍රේණියේ සිට 04 වන ශ්‍රේණිය දක්වා වූ විධායක නිළධාරීන්ට ගෙවමින් තිබූ විශේෂ ජීවන වියදම් දීමනාව 2017.10.17 වන දින සිට නතර කිරීමෙන් ඔවුනට අසාධාරණයක් සිදුවී ඇති බව තීරණය කරමි.

ඒ අනුව 2017.10.01 වන දින සිට 2023.03.31 දින දක්වා ධම්මික ජයවර්ධන මහතා ඇතුළු නිලධාරීන් 49 දෙනාට හිමි හිඟ විශේෂ ජීවන වියදම් දීමනාව වන රුපියල් හැත්තැලක්ෂ තුන්දහස් හයසිය විස්ස (රු. 7,003,620.00) ක මුදල පහත උපලේඛනයේ දක්වා ඇති ආකාරයට ප්‍රදානය කරමි.

තවද සේවක අර්ථසාධක අරමුදල ගණනයේදී මෙම හිඟ දීමනා ද ඇතුළත් කර ගණනය කිරීමට සහ මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළකළ දින සිට මාසයක කාලයක් ඇතුළත, ධම්මික ජයවර්ධන මහතා ඇතුළු සේවකයින් 49 දෙනාට හිමි හිඟ විශේෂ ජීවන වියදම් දීමනාව දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත ගෙවා නිම කිරීමට, අපනයන සංවර්ධන මණ්ඩලයට මෙයින් නියෝග කරමි.

මෙම ප්‍රදානයට අදාළ තීරණය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

**නීතිඥ ඩබ්.ඒ. බුද්ධික ප්‍රභාත් කරුණාතිලක,**
බේරුම්කරු.

උපලේඛනය

| අං. | නම | අර්ථ සාධක අංකය | 1996.12.31 දිනට | | විශේෂ ජීවන වියදම් දීමනාව (මූලික වැටුපෙන් 30% යි) මාසයක කාලසීමාවට | 2017.10.01 දින සිට 2023.01.04 දින දක්වා හිමි හිඟ ජීවන වියදම් දීමනාව (අවු. 05 මාස 06 යි) (රුපියල්) |
|---|---|---|---|---|---|---|
| | | | ශ්‍රේණිය | මූලික වැටුප (රුපියල්) | | |
| 1. | ධම්මික ජයවර්ධන මයා | 109 | 2 | 9,950.00 | 2,985.00 | 197,010.00 |
| 2. | ෂෙරීන් නිර්මාලා වන්නිතම්බි මෙය | 153 | 3 | 7,360.00 | 2,208.00 | 145,728.00 |
| 3. | ඩී. ටී. විජයරත්න මිය | 695 | 2 | 8,200.00 | 2,460.00 | 162,360.00 |
| 4. | එස්. හඳපාන්ගොඩ මිය | 112 | 3 | 6,900.00 | 2,070.00 | 136,620.00 |
| 5. | ඩබ්. ඩී. ඒ. පුෂ්පා රූපසිංහ මිය | 212 | 4 | 5,730.00 | 1,719.00 | 113,454.00 |
| 6. | ජීවනී සිරිවර්ධන මිය | 313 | 1 | 14,800.00 | 4,440.00 | 293,040.00 |
| 7. | යූ. කේ. දයානි වැගපිටිය මිය | 393 | 2 | 8,450.00 | 2,535.00 | 167,310.00 |
| 8. | එස්. එන්. තරංගනී මෙය | 721 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 9. | එන්. එන්. නාරන්දෙනිය මිය | 506 | 2 | 9,950.00 | 2,985.00 | 197,010.00 |
| 10. | ඕ. එම්. සී. කුමුදිනී මිය | 697 | 2 | 8,200.00 | 2,460.00 | 162,360.00 |
| 11. | ඩබ්. එම්. අයි. නිල්මිණි මෙය | 716 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 12. | පී. වී. ඒ. එම්. බද්දේගමගේ මිය | 555 | 2 | 8,450.00 | 2,535.00 | 167,310.00 |
| 13. | ඩී. කේ. ඩී. එස්. සිසිල් මයා | 646 | 3 | 6,100.00 | 1,830.00 | 120,780.00 |
| 14. | එම්. කේ. එස්. කේ මල්දෙනි මයා | 504 | 2 | 10,750.00 | 3,225.00 | 212,850.00 |
| 15. | සී. අමරසිංහ මයා | 543 | 2 | 9,950.00 | 2,985.00 | 197,010.00 |
| 16. | සී. දිසානායක මෙය | 315 | 2 | 8,200.00 | 2,460.00 | 162,360.00 |
| 17. | එස්. එස්. ජයවර්ධන මිය | 556 | 2 | 8,450.00 | 2,535.00 | 167,310.00 |
| 18. | එච්. ඩී. පත්බේරිය මයා | 644 | 2 | 9,200.00 | 2,760.00 | 182,160.00 |
| 19. | එස්. ඒ. ජී. සමන්ති මිය | 742 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 20. | කේ. එච්. ආර්. පී. ප්‍රනාන්දු මයා | 501 | 2 | 10,350.00 | 3,105.00 | 204,930.00 |
| 21. | එම්. ඩී. ඩී. ඒ. දිසානායක මිය | 760 | 3 | 6,100.00 | 1,830.00 | 120,780.00 |
| 22. | කුමුදුනී ඉරුගල්බණ්ඩාර මිය | 739 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 23. | එස්. ආර්. පී. ඉන්ද්‍රකීර්ති මයා | 756 | 2 | 9,200.00 | 2,760.00 | 182,160.00 |
| 24. | උපුල් අක්මීමන මයා | 525 | 3 | 6,100.00 | 1,830.00 | 120,780.00 |
| 25. | රම්‍යා චාන්දනී ධර්මවර්ධන මිය | 347 | 3 | 7,360.00 | 2,208.00 | 145,728.00 |

| අං. | නම | අර්ථ සාධක අංකය | 1996.12.31 දිනට | | විශේෂ ජීවන වියදම් දීමනාව (මූලික වැටුපෙන් 30% යි) මාසයක කාලසීමාවට | 2017.10.01 දින සිට 2023.01.04 දින දක්වා හිමි හිඟ ජීවන වියදම් දීමනාව (අවු. 05 මාස 06 යි) (රුපියල්) |
|---|---|---|---|---|---|---|
| | | | ශ්‍රේණිය | මූලික වැටුප (රුපියල්) | | |
| 26. | අයි. සී. අලහප්පෙරුම මිය | 387 | 2 | 9,950.00 | 2,985.00 | 197,010.00 |
| 27. | සී. පී. ජයසිංහ මයා | 448 | 2 | 9,950.00 | 2,985.00 | 197,010.00 |
| 28. | කේ. ඒ. වී. ප්‍රේමතිලක මිය | 554 | 2 | 8,200.00 | 2,460.00 | 162,360.00 |
| 29. | එන්. එච්. එම්. ජී. තිස්ස කුමාර මයා | 360 | 3 | 6,900.00 | 2,070.00 | 136,620.00 |
| 30. | සී. රත්නායක මෙය | 270 | 3 | 7,360.00 | 2,208.00 | 145,728.00 |
| 31. | ඩබ්. පී. ඒ. එන්. වීරවර්ධන මිය | 759 | 3 | 6,500.00 | 1,950.00 | 128,700.00 |
| 32. | එස්. ඒ. ජී. අනුරාධා මිය | 761 | 3 | 6,100.00 | 1,830.00 | 120,780.00 |
| 33. | එස්. ඒ. යූ. එම්. කේ විජේකෝන් මිය | 672 | 3 | 6,100.00 | 1,830.00 | 120,780.00 |
| 34. | කේ. කේ. එස්. කන්නංගර මිය | 725 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 35. | ඒ. පී. වික්‍රමසේකර මයා | 658 | 3 | 6,100.00 | 1,830.00 | 120,780.00 |
| 36. | පී. කේ. සුමිත්‍රාරච්චි මිය | 268 | 2 | 10,350.00 | 3,105.00 | 204,930.00 |
| 37. | ජේ. සී. සී. ද සිල්වා මිය | 467 | 4 | 6,770.00 | 2,031.00 | 134,046.00 |
| 38. | ජයනි ගලගෙදර මිය | 726 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 39. | එම්. ටී. එන් චන්ද්‍රසේන මිය | 461 | 4 | 5,730.00 | 1,719.00 | 113,454.00 |
| 40. | කේ. එම්. පී. කුලසේකර මයා | 715 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 41. | සී. ඩී. එස්. නුවරපක්ෂ මයා | 731 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 42. | ඩබ්. එච්. එම්. බී. සී. වීරරත්න මිය | 722 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 43. | ඩී. එම්. පී. දිසානායක මයා | 659 | 3 | 6,100.00 | 1,830.00 | 120,780.00 |
| 44. | ජී. එල්. සුසන්ත ප්‍රේමරත්න මයා | 737 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 45. | යූ. ඒ. ගමගේ මයා | 660 | 3 | 6,100.00 | 1,830.00 | 120,780.00 |
| 46. | අනෝමා කරල්ලියද්ද මිය | 557 | 2 | 8,450.00 | 2,535.00 | 167,310.00 |
| 47. | ජේ. එච්. ටී. කේ. ජයලත් මයා | 734 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 48. | කේ. එම්. කේ. ජයවර්ධන මිය | 740 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| 49. | ගයනි විජයතිලක මිය | 703 | 4 | 4,950.00 | 1,485.00 | 98,010.00 |
| | එකතුව | | | | | **7,003,620.00** |

EOG05 - 0081

*මගේ අංකය*: IR/COM/01/2022/17.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.11.21 දිනැති හා අංක 2307/07 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කඩවත, ඉහළ කරගහමුණ, සුහද මාවත, අංක 243/4 හි පදිංචි එස්. ඩී. එස් රාජපක්ෂ මයා සහ කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 609 හි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.04.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

*නඩු අංකය: A/82/2022.*
ගොනු අංක : IR/COM/01/2022/17.

එස්. ඩී. එස්. රාජපක්ෂ මහතා,
අංක. 243/ 4,
සුහද මාවත,
ඉහළ කරගහමුණ,
කඩවත.

*පළමු පාර්ශ්වය*

*එදිරිව*

ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව,
අංක 609,
දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින්, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, කී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ජනජිත් ද සිල්වා වන මා පත් කොට මා වෙත යොමු කර ඇත.

එකී යොමු කිරීමට පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණු වනුයේ,

''එස්.ඩී.එස්.රාජපක්ෂ මහතාට ලබා දී ඇති 2020.08.13 දිනැති විනය නියෝගයෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ''.

අද දින මෙම විමසීම නියමව ඇත්තේ වගඋත්තරකාර පාර්ශ්වය විසින් මතු කරන ලද මූලික විරෝධතාවය සම්බන්ධයෙන් වන නියෝගය සඳහාය. ඉල්ලුම්කරු විසින් මෙම ඉල්ලීම කම්කරු කොමසාරිස්වරයා වෙත යොමු කොට ඇත්තේ වර්ෂ 2020 අගෝස්තු මස 26 වන දින බව සැල කර සිටින අතර, එය වගඋත්තරකාර පාර්ශ්වය විසින් පිළිගනී. එකී ඉල්ලීම බේරුම්කරු වෙත යොමු කොට ඇත්තේ වර්ෂ 2022.11.14 වන දින දී ය. ඒ අනුව එකී යොමු කිරීමෙන් නියෝග කොට ඇති පරිදි ඉල්ලුම්කරු හට 2020.08.13 දිනැති විනය නියෝගයෙන් අසාධාරණයක් සිදු වී තිබේද, එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ලැබිය යුතු සහනයක් කවරේද යන්න පිළිබඳව විමසීමට පෙර මෙකී කරුණ විමසීමට භාජනය කිරීම සඳහා බේරුම්කරු වෙත අධිකරණ බලයක් තිබේද යන්න පරීක්ෂා කොට බැලිය යුතු වේ. මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය විසින් මෙම කරුණ පිළිබඳව විනිශ්චිත නඩු තීන්දු ගණනාවකදීම කරුණු දක්වා ඇති අතර එහිදී විශේෂයෙන්ම එස්. සුන්දරලිංගම් එදිරිව THE STATE BANK OF INDIA නඩු තීන්දුව ද, සුමිත් ආදිහෙට්ටි එදිරිව MERCANTILE INVESTMENT LIMITED සහ තවත් අය නඩු තීන්දුව ද මෙම කරුණ විමසීමට බඳුන් කොට ඇත. එහිදී පැහැදිලිවම දක්වා ඇත්තේ යම්කිසි කරුණක් බේරුම්කරණයකට භාජනය කිරීම සඳහා සජීවී සේවා ගිවිසුමක් පැවතිය යුතු බවයි. ඒ අනුව ඉල්ලුම්කරුට ඔහුගේ සේවා කාලය තුළදී යම්කිසි අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න විමසීමට පෙර මෙම කරුණ කම්කරු කොමසාරිස්වරයා වෙත යොමු කරන ලද දිනය වන 2020.08.26 වන දිනය වන විට ඉල්ලුම්කරු විශ්‍රාම ගොස් දින 13ක් ගෙවී ඇති බව පෙනී යයි. ඉන්පසුව අමාත්‍යවරයා විසින් මෙම කරුණ බේරුම්කරුට යොමු කොට ඇත්තේ වර්ෂ 2022 නොවැම්බර් මස 04 වන දිනදී වන අතර ඉහත සඳහන් දින දෙකම දෙස බලන විට ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු අතර සජීවී සේවා ගිවිසුමක් නොපවතින බව පෙනී යයි. එසේ හෙයින් ඉල්ලුම්කරු හට අසාධාරණයක් සිදුව තිබේද යන්න විමසා බැලීමට මෙම අධිකරණයට අධිකරණ බලයක් නොමැති බව පෙනී යයි. එසේ හෙයින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරමි. කෙසේ වෙතත් ගාස්තු නියම නොකරමි.

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**ජනජිත් ද සිල්වා,**
බේරුම්කරු.

2023 අප්‍රේල් මස 11 වැනි දින දී ය.

EOG05 - 0082